© සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / (All Rights Reserved)

3222

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

ජාතික අධ්‍යාපන ආයතනය
விභාග දෙපාර්තමේන්තුව
தேசிய கல்வி நிறுவகம்
பரீட்சைத் திணைக்களம்
NATIONAL INSTITUTE OF EDUCATION
DEPARTMENT OF EXAMINATIONS

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා - (2017/2018)

## අවසාන පරීක්ෂණය - 2019

## PE0110 (PE710) - අධ්‍යාපන මනෝවිද්‍යාව

II කොටස

ප්‍රශ්න හතරට පමණක් පිළිතුරු සපයන්න.

01. අධ්‍යාපන මනෝවිද්‍යාව විෂය ක්ෂේත්‍රය ගැටෙන් ඔබ මේ වන විට විවිධ පුද්ගල අධ්‍යයන ක්‍රම ඇතුළත් ව මනෝවිද්‍යාත්මක සංකල්ප රැසක් පිළිබඳ දැනුවත්භාවයක් ලබා තිබෙන අතර, ඒවා ගුරු භූමිකාව සඳහා අදාළ කර ගත හැකි ආකාරය පිළිබඳ ව අවධානය යොමු කිරීම මෙහෙයින් වැදගත් කාරණයකි.

(i) අධ්‍යාපන මනෝවිද්‍යාව යනු කුමක් දැ'යි නිර්වචනය කර, එය පෝෂණය වීම සඳහා උපකාරී වූ වෙනත් මනෝවිද්‍යා උප ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න.

(ලකුණු 03)

(ii) මනෝවිද්‍යාත්මක අධ්‍යයන ක්‍රමයක් වශයෙන් ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමය කෙටියෙන් හඳුන්වා, එය ශිෂ්‍යයකු සම්බන්ධ ව තොරතුරු රැස් කිරීමට යොදා ගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

(ලකුණු 05)

(iii) ගුරුවරයකු වශයෙන් පාඩම් සැලසුම් සකස් කිරීමේ දී හා ඒවා ක්‍රියාවට නංවන විට දී අධ්‍යාපන මනෝවිද්‍යාත්මක සංකල්ප ඔබට ඉවහල් කර ගත හැකි අවස්ථා හතරක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 08)

ළමා සංවර්ධන ක්‍රියාවලිය පදනම් ව ළමා සංවර්ධන අවධි ව්‍යුහයක් නිර්මාණය කිරීමට විවිධ මනෝවිද්‍යාත්මක ප්‍රවාද දායක වී ඇත.

(I) නව යොවුන් වියේ පසුවන ශිෂ්‍යයන් වෙතින් ප්‍රදර්ශනය වන ප්‍රධාන අවශ්‍යතා තුනක් ලියන්න.

(ලකුණු 03)

(II) පුද්ගල සංවර්ධනය පිළිබඳ ව සිග්මන් ෆ්‍රොයිඩ් විසින් දක්වා තිබෙන මනෝලිංගික සංවර්ධන අවධි පහ නම් කර, ඒවා කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

(III) නව යොවුන් වියේ පසුවන ශිෂ්‍යයන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් උදාහරණ සහිත ව විස්තර කරන්න.

(ලකුණු 08)

අ.පි.බ.

03. ප්‍රජානන ඉගෙනුම් න්‍යාය කාණ්ඩයට අයත් වන ගෙස්ටෝල්ට් න්‍යායේ අන්තර්ගත මූලධර්ම පංති කාමර ඉගෙනුම් අවස්ථා සංවිධානයේ දී විශාල මගපෙන්වීමක් සපයනු ලැබේ.

(i) චර්යාවාදී ඉගෙනුම් න්‍යායන්ට සාපේක්ෂ ව ප්‍රජානන ඉගෙනුම් න්‍යායන්ගේ දැකිය හැකි ප්‍රවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) ගෙස්ටෝල්ට් න්‍යායවාදීන් ප්‍රකාශ කළ ආකාරයට සංජානනය කෙරෙහි බලපාන විෂය බද්ධ සාධක පහක් රූපසටහන් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) ගෙස්ටෝල්ට් ඉගෙනුම් න්‍යාය පිළිබඳ අවබෝධය පංති කාමර ඉගෙනුම් අවස්ථා සංවිධානයේ දී ඉවහල් කර ගත හැකි ආකාර හතරක් උචිත උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 08)

04. "ගුරු භූමිකාවට අදාළ ප්‍රධාන කාර්යයක් වශයෙන් සිසුන් තුළ යහපත් පෞරුෂ ගුණාංග සංවර්ධනයට දායක වීම දැක්විය හැකි ය."

(i) පෞරුෂ සංකල්ප තුළ අන්තර්ගත ප්‍රවිශේෂී ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) සාර්ථක ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය කරන පෞරුෂ ගුණාංගයක් වන මෘදු කුසලතා (Soft Skills) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? සෑම ශිෂ්ටසම්පන්න සමාජයකට ම පොදු වන මෘදු කුසලතා හයක් ලියා දක්වන්න. (ලකුණු 06)

(iii) පෞරුෂ සංවර්ධන න්‍යායයන් පිළිබඳ ව ඔබ ලබා ගත් අවබෝධය පදනම් ව සිසුන් තුළ යහපත් පෞරුෂ ගුණාංග දියුණු කිරීම සඳහා ගුරුවරයකු වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග හතරක් විස්තර කරන්න. (ලකුණු 08)

05. අධ්‍යාපන කටයුතු සඳහා සිසුන් යොමු කරවන බලවේගයක් වශයෙන් අභිප්‍රේරණය හඳුන්වා දි[...] හැකි ය.

(i) අභිප්‍රේරණය පිළිබඳ ව මැක්ඩූගල්ගේ සහජ ලැදියා න්‍යාය මගින් හඳුන්වා දුන් සහජ ලැ[...] තුනක් හඳුන්වන්න. (ලකුණු 0[...]

(ii) අභිප්‍රේරණ ක්‍රියාවලිය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක නම් කර, ඒවා කෙටියෙන් පැ[...] කරන්න. (ලකුණු [...]

(iii) අභිප්‍රේරණය සම්බන්ධ ව ඉදිරිපත් ව පවතින න්‍යායන්ගේ අන්තර්ගත ප්‍රධාන මූලධර්ම [...] සඳහා ශිෂ්‍ය අභිප්‍රේරණය ඉහළ නැංවීමට ඉවහල් කර ගත හැකි අවස්ථා හතරක් [...] ඔස්සේ ශිෂ්‍ය අභිප්‍රේරණය සිදුවන ආකාරය විස්තර කරන්න. (ලකුණු [...]

06. ශිෂ්‍ය ස්මෘතිය වැඩි දියුණු කිරීම සඳහා ස්මෘති ක්‍රියාවලියේ ස්වභාවය සහ ස්මෘති අවධි [...] පැහැදිලි අවබෝධයක් ගුරුවරයකු තුළ පැවතීම වැදගත් වේ.

(i) ස්මෘති ක්‍රියාවලියේ ප්‍රධාන අදියර තුන කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු [...]

(ii) ස්මෘති අවධි යටතට ගැනෙන කෙටිකාලීන ස්මෘතිය යන්න හඳුන්වා, එයට තොරතුරු [...] ප්‍රධාන ක්‍රම තුන නම් කරන්න. (ලකුණු [...]

(iii) ශිෂ්‍ය ස්මෘතිය වැඩි දියුණු කිරීම සඳහා ඉවහල් කර ගත හැකි ක්‍රම ශිල්ප හතර[...] උගන්වන විෂය ක්ෂේත්‍ර ආශ්‍රිත උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු [...]

07. "ලඟා කර ගත යුතු අවසාන ඉලක්ක තිබිය දී ඒවා ලඟා කර ගැනීමට සුදුසු ක්‍රම විද්‍යමාන නොවන විට ගැටලු පැන නගියි."

(i) ගැටලු විසඳීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක **තුනක්** හඳුන්වන්න. (ලකුණු 03)

(ii) ගැටලු විසඳීම සඳහා භාවිතයට ගැනෙන විද්‍යාත්මක ක්‍රමයේ ප්‍රධාන පියවර **පහ** නම් කර, ඒවා කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

(iii) ශිෂ්‍යයන් තුළ ගැටලු විසඳීමේ හැකියාව සංවර්ධනය කිරීම සම්බන්ධ ගුරු කාර්යභාරය කරුණු **හතරක්** ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 08)

08. පංති කාමර ඉගැන්වීම් කටයුතුවල දී සුහග හා විශිෂ්ට කුසලතා පෙන්වන ශිෂ්‍යයන් විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් වශයෙන් හඳුනා ගැනීම මෙන් ම ඔවුන් ඉදිරි පෝෂණයට ලක් කිරීම සෑම ගුරුවරයකුගේ ම වගකීමකි.

(i) "විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන්" නම් සංකල්පය අර්ථකථනය කර, විශේෂ අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) සුහග හා විශිෂ්ට කුසලතා දක්වන ශිෂ්‍යයන්ට පාසල එපා වීමට හෝ පාසල් අධ්‍යාපනය පිළිබඳ සෘණාත්මක සිතිවිලි පැන නැගීමට බලපෑ හැකි හේතු **පහක්** කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iii) ඔබේ පංති කාමරය තුළ ඉගෙනුම ලබන සුහග ශිෂ්‍යයන්ගේ හැකියා තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ඔබගේ විෂය ඉගැන්වීම් පරාසය තුළ අනුගමනය කළ හැකි ඉදිරි පෝෂණ ක්‍රියාමාර්ග **හතරක්** විස්තර කරන්න. (ලකුණු 08)

********